IHRA
UNIVERSITY OF COLOMBO

## මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2014/15

**(ප්‍රථම සෙමෙස්තර පරීක්ෂණය)**

**(පවත්වන ලද්දේ 2016 ඔක්තෝම්බර්)**

## BLE 301 - මානව සම්පත් කළමනාකරණය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. (අ) සුදුසු ආකෘතියක් ආශ්‍රයෙන් මානව සම්පත් කළමනාකරණ විෂයයේ අන්තර්ගතය විස්තර කරන්න.

(ලකුණු 09)

(ආ) මානව සම්පත් කළමනාකරණය සඳහා පිළිගතහැකි නිර්වචන තුනක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 08)

(ඇ) ''සෑම කළමනාකරුවකුම මානව සම්පත් කළමනාකරුවෙකි'' මෙම ප්‍රකාශයට පක්ෂව සහ විපක්ෂව කරුණු ඉදිරිපත් කරන්න .

(ලකුණු 08)

(මුළු ලකුණු 25)

02. (අ) රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුර සඳහා රැකියා විස්තරයක් සහ රැකියා පිරිපතයක් පිළියෙල කරන්න.

(ලකුණු 16)

(ආ) මානව සම්පත් සැලසුම්කරණ ක්‍රියාවලිය සැකෙවින් විස්තර කරන්න.

(ලකුණු 09)

(මුළු ලකුණු 25)

03. (අ) පහත දැක්වෙන්නේ රැකියා පුරප්පාඩු පිළිබඳ කල්පිත පුවත්පත් දැන්වීමකි.

**<u>රැකියා පුරප්පාඩු.</u>**

ලිපිකරු

මූල්‍ය කළමනාකරු

ආරක්ෂක නිලධාරී

රියදුරු

අලෙවි කළමනාකරු

මුදල් අයකැමි

කම්කරු

පිළිගැනීමේ නිලධාරිනි

ව්‍යාපෘති සහකාර

ලේකම්

තැපැල් පෙට්ටිය XXXX,
කොළඹ.

පුවත්පත් දැන්වීම පළවී සති හතරක් ගතවුවත් ඒ සඳහා වන ප්‍රතිචාර ඉතා අවම බව ආයතනයේ කළමනාකරණයට දැකගත හැකිවිය.

i මෙම අවම ප්‍රතිචාර ඇතිවීම කෙරෙහි බලපානු ලැබූ හේතු ඔබ විග්‍රහකරන්නේ කේසේද ?

(ලකුණු 09)

ii. මෙම පුවත්පත් දැන්වීම වැඩි ප්‍රතිචාරයක් ලැබෙන සේ නැවත පිළියෙල කරන්න.

(ලකුණු 08)

(ආ) සේවකයින් තොරා ගැනීමේ විවධ අදියරයන් රූපසටහනක් ආශ්‍රයෙන් පැහැදිළි කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 25)

04. (අ) සේවකයින් බඳවා ගැනීමට (Hiring) අදාල පියවරයන් විස්තර කරන්න.

(ලකුණු 09)

(ආ) රැකියා ඇගයීම් ක්‍රම නම්කර ඉන් දෙකක් විස්තර කරන්න.

(ලකුණු 08)

(ඇ) වැටුප් හා වේතන සම්භන්ධ සාධාරණත්ව සංකල්ප පැහැදිළි කරන්න

(ලකුණු 08)
(මුළු ලකුණු 25)

05. පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටිසටහන් ලියන්න.

i. විනය කඩවීම් වර්ගීකරණය.

ii. විනය පරීක්ෂණ.

iii. සේවක සුභසාධනය.

iv. සෞඛ්‍ය ආරක්ෂාව.

v. දුක්ගැනවිලි.

(ලකුණු 05 x 05 )
(මුළු ලකුණු 25)